# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1 ශ්‍රේණිය -බුද්ධ ධර්මය - ජනවාරි මාසය - 2 වන සතිය

සැකසුම :- බලංගොඩ අධ්‍යාපන කලාපය.
ප්‍රා. ගුරු උපදේශක :- බන්දුප්‍රේම ඕපනායක

- ඔයාලා පුතේ ගුරුවරුන්ගේ වටිනාකම දැනටමත් දන්නවා.
- ගුරු පියවරු, ,ගුරු මෑණිවරු අපව යහමග යවන්න ගොඩක් උත්සාහ ගන්නවා.
- අපිට හරිම ආදරෙයි.
- ඒ නිසා ගුරුවරයෙකු දුටු විට ආසනයෙන් නැගිට ආචාර කරන්න ඕනි.
- අපි දැන් ගුරුවරුන්ගේ වටිනාකම ගැන කියවෙන කවියක් ගායනා කරමු.

ඔවා සිප් දීමෙන
මා හික්මවන පේමෙන
ඇදුරු හද බැතියෙන
වදිමි ගරු සිත පෙරටු කරමින

- මෙම කවියත් පාඩම් කර ගෙන අදහස සිතට ගන්න.
- දින පතාම මවටත් මගේ තාත්තටත් වදිනවා.
- ගුරුතුමාට පාසලේදී නමස්කාර කරනවා.
- හැකි හැම විට යහලුවන්ට උදව් වෙන්න බලනවා.
- "සතුනට හිංසා නොකරමි" උන්ටත් එය දැනෙනවා.

**"හොදයි ආදරණීය දුවේ, පුතේ ඔයාලට තෙරුවන් සරණයි!"**